ජිනේන්ද්‍ර කොතලාවල මහතා, ස්වාධීන උපදේශක



ජිනේන්ද්‍ර කොතලාවල මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් කළමනාකරණ ක්ෂේත්‍රයේ උපාධියක් සහ පශ්චාත් උපාධියක් ලබා ඇත. වසර 28 කට වැඩි පළපුරුද්දක් ඇති ඔහු දැන් සමාජ සමීක්ෂණ මෙන්ම අධීක්ෂණ සහ ඇගයීම් වැඩ පැවරුම්වල නිරත වන ස්වාධීන උපදේශකයෙකි. ඔහු මීට පෙර සීමාසහිත නීල්සන් ලංකා (පුද්ගලික) සමාගමේ සමාජ පර්යේෂණ අධ්‍යක්ෂ ලෙස සේවය කළේය. ඔහු ශ්‍රී ලංකා ඇගයීම් සංගමයේ (SLEvA) වත්මන් සභාපතිවරයා ලෙසද කටයුතු කරයි.

යුක්තිය, පළාත් පාලනය, මහජන සංජානන, සාමය ගොඩ නැගීම, මහජන සෞඛ්‍ය සේවා, වැඩිහිටියන්, අඩු ආදායම්, දරිද්‍රතාවය, යුද්ධයෙන් පීඩාවට පත්වූ, විශේෂිත අව්‍යශතා සහිත පුද්ගලයින්, තරුණයින්, කාන්තා අයිතිවාසිකම්, ළමා අයිතිවාසිකම්, ආපදාවලින් පීඩාවට පත් ප්‍රජාවන් සහ වෙනත් විවිධ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් ආදිය සඳහා ප්‍රවේශය වැනි විවිධ අංශ ඔහුගේ සමීක්ෂණ අත්දැකීම් අතරට ඇතුළත් වේ.මාලදිවයින, ඉන්දියාව, බංග්ලාදේශය, නේපාලය සහ භූතානය යන දකුණු ආසියානු රටවල ද ඔහුට සේවා පළපුරුද්දක් ඇත. ඔහු දැනට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ ආචාර්ය උපාධියක් හදාරමින් සිටී.